NaCl, $C_6H_{12}O_6$, $Ca(OH)_2$, $BaSO_4$,NaOH, LiCl

(02) සංයෝගයක ජල ද්‍රාව්‍යතාවය රඳා පවතින වැදගත් සාධක 2 ක් ලෙස දැලිස් එන්තැල්පිය හා සද්‍රාවණ එන්තැල්පිය වැදගත් වේ. ඒ අනුව සංයෝගයක ජලයේ ද්‍රාව්‍යතාවය ශක්ති විද්‍යාත්මකව පහදා දෙන්න.

(03) i. අණු ලෙස හා අයන ලෙස ද්‍රාවණ ගතවන සංයෝග 2 ක් ඉහත උදාහරණ ඇසුරින් තෝරා ලියන්න.
ii. එහිදී සිදුවන ක්‍රියාව සමීකරණයකින් දක්වන්න.

(04) අයනික සන්නායකතාව අනුව ඉහත ද්‍රාවණ දෙක විද්‍යුත් විච්ඡේද්‍ය හා අවිච්ඡේද්‍ය ලෙස නම් කරන්න.

(05) ලවණයක ද්‍රාව්‍යතාව උෂ්ණත්වය මත රඳා පවතින අතර ද්‍රාව්‍යතාව අනුව ජලීය ද්‍රාවණ වර්ග කල හැකි ආකාර 3 කවරේද?

(06) MX නම් අයනික ලවණයක සංතෘප්ත ද්‍රාවණයක් සාදාගන්නේ කෙසේද? එහිදී ඇතිවන සමතුලිත පද්ධතිය සමීකරණයක් ඇසුරෙන් දක්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

(07) ඉහත ඇතිවන විෂම ජානීය රසායනික ගතික සමතුලිත පද්ධතියේ ඉදිරි හා ආපසු ප්‍රතික්‍රියා වල සීඝ්‍රතාව කාලය සමඟ විචලනය වන ආකාරය ප්‍රස්ථාරයකින් නිරූපණය කරන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

(08) සමතුලිත සාන්ද්‍රණ හෙවත් ද්‍රාවතාවයේ ඒකක මොනවාද?

..........................................................................................................................................................

(09) ඉහත ඒකක අතරින් බහුලව භාවිතා කරන ඒකකය කුමක්ද?

..........................................................................................................................................................

(10) ජලයේ මඳ වශයෙන් ද්‍රාව්‍ය ප්‍රබල විද්‍යුත් විච්ඡේදයක් මත AgCl හි සංතෘප්ත ජලීය ද්‍රාවණයක පවතින සමතුලිතතාවයට අදාල සමීකරණය ලියන්න.

..........................................................................................................................................................

(11) එම පද්ධතිය සඳහා Kc සඳහා ප්‍රකාශනය ලියන්න. එමගින් ද්‍රාව්‍යතා ගුණිතය හෙවත් ksp සඳහා ප්‍රකාශනය ලබාගන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

(12) $MX_{(s)}$ හා $M_mX_{n(s)}$ යන ජලයේ මඳ වශයෙන් ද්‍රාව්‍ය අයනික ඝන සඳහා වන සමතුලිත ප්‍රකාශන (ksp) ලබා ගන්න. (භෞතික අවස්ථා දක්වමින් අදාල තුලිත සමීකරණ ලිවිය යුතුයි.)

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

(13) සම්මත සාන්ද්‍රණයට සාපේක්ෂව Ksp සඳහා ඒකක පවතීද?

.......................................................................................................................................................

(14) ඉහත (12) ප්‍රශ්ණයේ උදාහරණවලට අදාලව Ksp සඳහා ඒකක ව්‍යුත්පන්න කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(15) ඉහත (14) ට අදාලව Ksp සඳහා ලැබෙන ඒකක සමානවේ ද? වෙනස් වේ ද? ඒ පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(16) ද්‍රාව්‍යතාව $Xmoldm^{-3}$ සේ සලකා පහත මද වශයෙන් ද්‍රාව්‍ය අයනික සංයෝග වල ද්‍රාව්‍යතාවය කෙරෙහි Ksp ප්‍රකාශන ලියන්න.

$Ba_3(PO_4)_2$, $PbI_{2(s)}$, $AS_2S_{3(s)}$, $Ag_2CrO_{4(s)}$

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(17) 298k දී $PbI_{2(s)}$ $5.60x10^{-2}g$ ක් ද්‍රාවණය කර $PbI_2$ හි සංතෘප්ත ද්‍රාවණ $100cm^3$ ක් පිළියෙල කර ගන්නා ලදී. $PbI_{2(s)}$ හි ksp ගණනය කරන්න. (මවුලික ස්කන්ධය $PbI_2 = 461gmol^{-1}$)

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(18) $25^0C$ $AgCl_{(s)}$ සංතෘප්ත ජලීය ද්‍රාවණයක AgCl හි ද්‍රාව්‍යතා ගුණිතය $1x10^{-10}mol^2dm^{-6}$ නම් එම ද්‍රාවණයේ $AgCl_{(s)}$ ද්‍රාව්‍යතාවය ගණනය කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(19) අයනික ජලීය ද්‍රවණ 2 ක් මිශ්‍ර කල විට අවක්ෂේපයක් ඇතිවේද නොවේද යන්න තීරණය කරනුයේ අවක්ෂේපිත සංයෝගයේ ද්‍රාව්‍යතා ගුණිතයත් එම සංතෘප්ත ජලීය ද්‍රාවණයේ ඇති අයන සාන්ද්‍රණ ගුණිතයත් අතර සම්බන්ධය අනුවයි. ඉහත සම්බන්ධතාව අනුව අවක්ෂේප ඇතිවීම තීරණය කරන්නේ කෙසේද?

(20) $AgNO_{3(aq)}$ හා $Na_2S_{3(aq)}$ ජලීය ද්‍රාවණ 2 ක් මිශ්‍ර කල විට සෑදෙන ද්‍රාවනයේ $Ag^{+}_{(aq)}$ සාන්ද්‍රණය $8x10^{-4}$ $moldm^{-3}$ වේ. $S^{2-}_{(aq)}$ සාන්ද්‍රණය $1.5x10^{-5}moldm^{-3}$වේ. $ksp(Ag_2S_{(s)}) = 1.6x10^{-49}mol^3dm^{-9}$වේ නම් $Ag_2S_{(s)}$ අවක්ෂේපයක් ඇතිවේද? නොවේද? යන්න සුදුසු ගණනය කිරීමකින් පෙන්වා දෙන්න.

(21) $1x10^{-3}$ $moldm^{-3}$ $CaCl_2$ ද්‍රාවණ $50cm^3$ ක් $1x10^{-2}$ $moldm^{-3}$ $Na_2SO_4$ ද්‍රාවණ $50cm^3$ ක් සමඟ මිශ්‍රකල විට අවක්ෂේපයක් සෑදේද? $(Ca_2SO_4)_{(s)} = 2.4x10^5 mol^2dm^{-6}$)

(22) 298k දී AgCl සංතෘප්ත ජලීය ද්‍රාවණයක ඇති පහත සමතුලිතය සලකන්න.

i. මෙහි ද්‍රාවණ ගත වී ඇති අයන මොනවාද?

ii. ඉහත ජලය ද්‍රාවණයට 298k දී $NaCl_{(aq)}$ ද්‍රාවණයක් එකතු කල විට ලේවැටලියර් මූලධර්මයට අනුව ඉහත සමතුලිත පද්ධතියට කුමක් සිදුවේද? එවිට AgCl ද්‍රාව්‍යතාව අඩුවේද? වැඩිවේද? පහදන්න.

(23) $AgCl_{(s)}$ සමතුලිත පද්ධතියට $NaCl_{(aq)}$ එකතු කල විට බාහිරින් $Cl^-$ පොදු අයනයක් ලෙස බලපා ඇත. $Cl^-$ මගින් ඉහත සමතුලිත පද්ධතියේ AgCl ද්‍රාව්‍යතාවයේ වෙනසක් සිදුකර ඇත. මෙය පොදු අයන ආවරණයයි.

පහත පද්ධති වලට බලපාන පොදු අයන මොනවාද?

i. $Ni(OH)_{2(s)}$ හා $NaOH_{(aq)}$

ii. $BaCl_{2(aq)}$ හා $BaCrO_{4(s)}$

(24) 0.1M $NaOH_{(aq)}$ ද්‍රාවණයක $Ni(OH)_2$ හි මවුලික ද්‍රාව්‍යතාව ගණනය කරන්න.
ksp $Ni(OH)_{2(s)} = 2x10^{-15} mol^3dm^{-9}$

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(25) $PbCl_{2(s)} \rightleftharpoons Pb^{2+}_{(aq)} + 2Clb^{-}_{(aq)}$ මෙම පද්ධතියට $Br^-$, $C_2O_4^{2-}$ , $I^-$, $SO_4^{2-}$ වැනි ඕනෑම අයනයක් එකතු කිරීමෙන් $Pb^{2+}$ ප්‍රමාණය අඩු කිරීම මගින් ලේචැටලියර් මූලධර්මයට අනුව ඉදිරි ප්‍රතික්‍රියාව සිදුකර $PbCl_2$ හි ද්‍රාව්‍යතාව වැඩිකල හැකිද?

..............................................................................................................................................

(26) $PbCO_{4(s)}ksp \ = 2.5x10^{-5} mol^2dm^{-6}$

$PbC_2O_{4(s)}ksp \ = 4.8x10^{-10} mol^2dm^{-6}$

$PbI_{2(s)}ksp \ = 9.8x10^{-9} mol^3dm^{-9}$

($Pb^{2+}$ අවක්ෂේප කිරීමට එකතු කරන විවිධ ඇනායන වලින් සෑදෙන අවක්ෂේප වල ksp අගයන් $PbCl_2$ හි ksp අගය 0 ට වඩා අඩුවිය යුතුයි.)

$kspPbCl_{2(s)} = 1.8x10^{-5} mol^3dm^{-9}$

ඒ අනුව ඉහත කවර ඇනායනය එකතු කිරීම මගින් $PbCl_2$ හි ද්‍රාව්‍යතාව වැඩිකර ගත හැකිද?

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(27) $MA_{(s)} \rightleftharpoons M^{+}_{(aq)} + A^{-}_{(aq)}$ පද්ධතිය සඳහා වන ksp ප්‍රකාශනය ලියන්න.
මෙම පද්ධතියට ප්‍රබල අම්ලයකින් ස්වල්පයක් එකතු කල විට $MA_{(s)}$ හි ද්‍රාව්‍යතාවයට සිදුවන වෙනස ඉහත ප්‍රතික්‍රියාව ඇසුරින් පැහැදිලි කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(28) $Ag_3PO_{4(s)} \rightleftharpoons 3Ag^{+}_{(aq)} + PO^{3-}_{4(aq)}$ පද්ධතියට $HNO_{3(aq)}$ එකතු කල විට $Ag_3PO_4$ ද්‍රාව්‍යතාවයේ සිදුවන වෙනස පැහැදිලි කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(29) 298k දී (I) PH 10 වූ විට හා (II) PH 5 වූ විට $Cu(OH)_2$ සංතෘප්ත ද්‍රාවණයක $Cu^{2+}_{(aq)}$ සාන්ද්‍රණය ගණනය කරන්න.
$kspCu(OH)_{2(s)} = 2.2x10^{-20} mol^3dm^{-3}$

.......................................................................................................................................................

(30) දුබල අම්ල වලින් ව්‍යුත්පන්න වූ $F^-, C_2O_4^{\ 2-}, CO_3^{\ 2-}, PO_4^{\ 3-}$ ආදී ලවණ ආම්ලික ද්‍රාවණ වල වැඩියෙන් ද්‍රවණය වීමට නැඹුරු වේ. $CaF_{2(s)}$ සංතෘප්ත ජලීය ද්‍රාවණයකට ප්‍රබල අම්ලයක් එක්කල විට සිදුවන ක්‍රියාව උදාහරණ ලෙස ගනිමින් මෙම ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(31) $PbI_{2(s)} \rightleftharpoons Pb^{2+}_{(aq)} + 2I^-_{(aq)}$ යන සමතුලිතය සලකන්න. $Cl^-$, $Br^-$, $I^-$ වැනි ඇනායන අඩංගු ලවණ වල ද්‍රාව්‍යතාවය කෙරෙහි pH අගයෙහි බලපෑමක් ඇති නොවන බව ඉහත උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

(32) කැටායන කාණ්ඩ 5 ට වර්ග කිරීම සඳහා එම කැටායන අඩංගු ජලීය ද්‍රාවණ වල ද්‍රාව්‍යතාවය සලකා බලයි. එම එක් එක් කාන්ඩයේ දී අවක්ෂේප වන කැටායන වර්ග, ඒවා සාදන සංයෝග වල වර්ණ හා අවක්ෂේප ඇතිවීමට යොදන ප්‍රතිකාරක හා තත්ත්ව සඳහන් කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(33) II වන කාණ්ඩයේ හා IV වන කාණ්ඩයේ කැටායන ඒවායේ සල්ෆයිඩ ලෙස අවක්ෂේප කිරීම සඳහා ද්‍රාව්‍යතා ගුණිතයේ මූලධර්ම යෙදෙන ආකාරය පැහැදිලි කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(34) $Pb^{2+}$ I හා II යන කාණ්ඩ 2 දීම අවක්ෂේප වීමට හේතුව පැහැදිලි කරන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

(35) III කාණ්ඩයේ දී $Mg^{2+}$ අයන $Mg(OH)_2$ ලෙස අවක්ෂේප නොවන්නේ ඇයි?

.......................................................................................................................................................

.......................................................................................................................................................

(36) ද්‍රාවණයක $0.1moldm^{-3}$ $Zn^{2+}$ හා $0.1moldm^{-3}$ $Fe^{2+}$ අඩංගු වේ. ද්‍රාවණය තුලින් $H_2S$ යැවීමෙන් ඒවා වෙන්කර ගත යුතු වේ නම් ද්‍රාවනයේ pH අගය කුමක් විය යුතුද? ද්‍රාවණයේ $H_2S$ සාන්ද්‍රණය $0.10\,moldm^{-3}$

$Zn_{(s)} S ksp$ $1.6 x 10^{-24} mol^2 dm^{-6}$

$ksp FeS_{(s)}$ $6.3 x 10^{-18} mol^2 dm^{-6}$

ඉහත ගණනය කිරීම ඇසුරෙන් වරණීය අවක්ෂේපනයේ දී pH අගයේ වැදගත්කම විස්තර කරන්න.

(37) $Ca(OH)_{2(s)}$ ද්‍රාව්‍යතා ගුණිතය පරීක්ෂණාත්මකව සොයන ආකාරය විස්තර කරන්න.

$0.1 moldm^{-3}$ NaOH ද්‍රාවණයකින් $25cm^3$ ත් ආශ්‍රැත ජලය $75cm^3$ ක් සමඟ මිශ්‍ර කර සාදාගත් ද්‍රාවණය $Ca(OH)_2$ වලින් සංතෘප්ත කරනු ලැබේ. එලෙසම $Ca(OH)_2$ වලින් සංතෘප්ත කරන ලද ද්‍රාවණයෙන් $20cm^3$ $0.1moldm^{-3}$ HCl සමඟ අනුමාපනය කරනු ලැබේ. අන්ත ලක්ෂයේ දී බියුරෙට්ටු පාඨාංකය $14.3cm^3$ වේ. $Ca(OH)_2$ හි ksp ගණනය කරන්න.

NaOH ජලීය ද්‍රාවණයක් එකතු කරන්නේ ඇයි?

# ද්‍රාව්‍යතා සමතුලිතතාවය (Ksp) - පිළිතුරු

(01) ජලයේ හොඳින් දියවන - NaCl, NaOH, $C_6H_{12}O_6$,
අල්ප වශයෙන් දියවන - $Ca(OH)_2$, $BaSO_4$,
ඉතා අල්ප ද්‍රාව්‍ය (අද්‍රාව්‍යය) - LiCl

(02) ලවණයක් ද්‍රාවණයක දියවීමට නම් එහි අයන අතර පවත්නා ප්‍රබල ආකර්ෂණ බල, අයන, ද්‍රාවක අන්තර් ක්‍රියා විසින් මැඩ පවත්වනු ලැබිය යුතුය. එනම් සදාවරණ එන්තැල්පිය විසින්, දැලිස් එන්තැල්පිය මැඩපැවැත්විය හැකි පරිදි සදාවරණ එන්තැල්පිය, දැලිස් එන්තැල්පියට වඩා විශාල විය යුතුය.

(03) i. NaCl, $C_6H_{12}O_6$
ii. $NaCl_{(s)} \rightarrow Na^+{}_{(aq)} + Cl^-{}_{(aq)}$
$C_6H_{12}O_{6(s)} \rightarrow C_6H_{12}O_{6(aq)}$

(04) විද්‍යුත් විච්ඡේද්‍ය - NaCl විද්‍යුත් අවිච්ඡේද්‍ය - $C_6H_{12}O_6$

(05) I. වර්ගය - ද්‍රාව්‍ය - ද්‍රාව්‍යතාව $> 0.10 mol\,dm^{-3}$
II. වර්ගය - තරමක් ද්‍රාව්‍ය - $0.01\ moldm^{-5} <$ ද්‍රාව්‍යතාව $< 0.10 mol\,dm^{-3}$
III. වර්ගය - ස්වල්පයක් වශයෙන් ද්‍රාව්‍ය - ද්‍රාව්‍යතාව $< 0.01\ mol\,dm^{-3}$

(06) ඍජු ක්‍රමය - වැඩිපුර MX ලවණය බීකරය පතුලේ ඉතිරි වනතුරු වේගයෙන් කලතමින් MX ඝනය ජලයට එකතු කිරීම.
වක්‍ර ක්‍රමය - $M^+$ අයනය අඩංගු ද්‍රාවණයනක් හා $X^-$ අයනය අඩංගු තවත් ද්‍රාවණයක් මිශ්‍ර කිරීම. එක්තරා අවස්ථාවක දී සංතෘප්ත ද්‍රාවණයක් සෑදෙනු ඇත.

(07)




(08) $moldm^{-3}, gdm^{-3}, gcm^{-3}$

(09) $moldm^{-3}$

(10) $AgCl_{(s)} \rightleftharpoons Ag^+{}_{(aq)} + Cl^-{}_{(aq)}$

(11) $k_c = \frac{[Ag^+{}_{(aq)}]\ [Cl^-{}_{(aq)}]}{[Ag^+{}_{(s)}]}$

සංශුද්ධ ඝන ද්‍රව්‍යයක සාන්ද්‍රණය නියත බැවින්,

$k[AgCl] = [Ag^+{}_{(aq)}][Cl^+{}_{(aq)}]$

$\therefore ksp \quad = [Ag^+{}_{(aq)}][Ag^+{}_{(aq)}]$

(12) $Mx_{(s)} \rightleftharpoons M^+{}_{(aq)} + X^-{}_{(aq)}$

$ksp = [M^+{}_{(aq)}][X^-{}_{(aq)}]$

$M_mX_n \rightleftharpoons \mathrm{m}M^{n+}{}_{(aq)} + nX^{m-}{}_{(aq)}$

$ksp = [M^{n+}{}_{(aq)}]^m[X^{m-}{}_{(aq)}]^n$

(13) නැත

(14) $ksp = mol^2dm^{-6}$

$ksp = mol^{(m+n)}dm^{-3(m+n)}$

(15) සමාන නොවේ. ස්ටොයිකියෝමිතික සමීකරණය වෙනස් වන නිසා ඒ අනුව ද්‍රාව්‍යතා ගුණිත ප්‍රකාශනය වෙනස් වේ.

(16) $Ba_3(Po_4)_{2(s)} \rightleftharpoons 3\mathrm{Ba}^{2+}{}_{(\mathrm{aq})} + 2\mathrm{Po}_4{}^{3-}{}_{(\mathrm{aq})}$

$moldm^{-3} \qquad 3\mathrm{x} \qquad 2\mathrm{x}$

$\mathrm{ksp} = [\mathrm{Ba}^{2+}{}_{(\mathrm{aq})}]^3[\mathrm{Po}_4{}^{3-}]^2$

$= (3x)^3\,x(2x)^2 = 108x^5mol^5dm^{-15}$

$Pbi_{2(s)} \rightleftharpoons \mathrm{Pb}^{2+}{}_{(\mathrm{aq})} + 2\mathrm{I}^-{}_{(\mathrm{aq})}$

$moldm^{-3} \qquad \mathrm{x} \qquad 2\mathrm{x}$

$\mathrm{ksp} = [\mathrm{Pb}^{2+}{}_{(\mathrm{aq})}]^3[\mathrm{I}^-{}_{(\mathrm{aq})}]^2$

$x \qquad (2x)^2 \quad = 4x^3mol^3dm^{-9}$

$As_2s_{3(s)} \rightleftharpoons 2\mathrm{As}_{(\mathrm{aq})}{}^{3+} + 3s^{-2}$

$2\mathrm{x} \qquad 3\mathrm{x}$

$\mathrm{ksp} = [\mathrm{As}_{(\mathrm{aq})}{}^{3+}]^2[s^{-2}]^3$

$= (2x)^2(3x)^3 = 108x^5mol^5dm^{-15}$

$Ag_2CrO_{4(s)} \rightleftharpoons 2\mathrm{Ag}_{(\mathrm{aq})}{}^+ + CrO^2{}_{4(aq)}$

$2\mathrm{x} \qquad \mathrm{x}$

$\mathrm{ksp} = [\mathrm{Ag}^+{}_{(\mathrm{aq})}]^2[CrO_4{}^{2-}{}_{(aq)}]$

$= (2x)^2\,x = 4x^3mol^3dm^{-9}$

(17) 2.27 නිදසුන

ද්‍රාව්‍යතාව හා ද්‍රාව්‍යතා ගුණිතය ආශ්‍රිත ගණනය කිරීම් (සම්පත් පොත)

(18) $AgCl_{(s)} \rightleftharpoons Ag^{+}{}_{(aq)} + Cl^{-}{}_{(aq)}$

$moldm^{-5}$ x x

මවුලික ද්‍රාව්‍යතාව x නම්,

සමතුලිතතාවයේ දී,

$ksp = [Ag^{+}{}_{(aq)}][Cl^{-}{}_{(aq)}]$

$1x10^{-10} mol^{2} dm^{-6} = x^{2}$

$1x10^{-5} moldm^{-3} = x$

(19) අයනික ගුණිතය > ksp - අවක්ෂේපයක් සෑදේ.

අයනික ගුණිතය = ksp ද්‍රාවණය සංතෘප්තය - අවක්ෂේපයක් නොසෑදේ.

අයනික ගුණිතය < ksp ද්‍රාවණය සංතෘප්තය - අවක්ෂේපයක් නොසෑදේ.

(20) $2Ag^{+}{}_{(aq)} + S^{2-}{}_{(aq)} \rightleftharpoons Ag_2S_{(s)}$

අයනික ගුණිතය

$= [Ag^{+}{}_{(aq)}]^{2}[S^{2-}{}_{(aq)}]$

$= (8x10^{-4} moldm^{3-})^{2}(1.5x10^{-5} moldm^{5})$

$= 9.6x10^{-12} mol^{3} dm^{-9}$

නමුත් $ksp = (Ag_2S) = 1.6x10^{-49} mol^{3} dm^{-9}$

$\therefore Ag_2S$ අවක්ෂේප වේ.

(21) 2.32 නිදසුන

(අවක්ෂේපයක් සෑදීම පෙරයීම)

(22) i. $Ag^{+}, Cl^{-}$

ii. $[Cl^{-}]$ වැඩිවීම නිසා ksp නියතව තබා ගැනීමට සංතුලිතනය වමට විතැන් වේ.

(23) i. $(OH)^{-}$

ii. $Ba^{2+}$

(24) ද්‍රාව්‍යතාවය කෙරෙහි බලපාන සාධක පොදු අයන ආවරනය (2.36 නිදසුන)

(25) නොහැකිය.

(26) $C_2O_4^{2-}, I^{-}$, $\rightarrow$ ද්‍රාව්‍යතාව වැඩි කර ගත හැක.

$SO_4^{2-}$ $\rightarrow$ ද්‍රාව්‍යතාව වැඩි කර ගත නොහැක.

$$\begin{pmatrix} ksp & & ksp \\ & < & \\ PbCl_2 & & PbSO_4 \end{pmatrix}$$

(27) $MA_{(s)} \rightleftharpoons M^{+}{}_{(aq)} + A^{-}{}_{(aq)}$

$ksp = [M^{+}{}_{(aq)}][A^{-}{}_{(aq)}]$

මෙයට ප්‍රබල අම්ලයක් එකතු කළහොත් එකතු කළ $H^{+}$ සම්පූර්ණයෙන්ම පාහේ $A^{-}$ සමඟ ප්‍රතික්‍රියා වී HA සාදයි. මෙය $[A^{-}{}_{(aq)}]$ අඩු කරන අතර, ඒ නිසා අයනික ගුණිතයේ විශාලත්වය ද අඩුවේ. ලේචැටලියර් මූලධර්මයට අනුව අයනික ගුණිතය, ද්‍රාව්‍යතා ගුණිතයට සමාන වනතුරු තව තවත් MA ද්‍රාවණය වේ.

(28) $Ag_3PO_{4(s)} \rightleftharpoons 3Ag^+_{(aq)} + PO_4^{3-}{}_{(aq)}$

$HNO_3$ අම්ලය එකතු කල විට පහත ප්‍රතික්‍රියාව සිදුවේ.

$H_3O^+_{(aq)} + PO_4^{3-}{}_{(aq)}\ HPO_4^{2+}{}_{(aq)} + H_2O_{(e)}$

මෙමගින් ද්‍රාවණයේ $PO_4^{3-}$ අයන අඩු කරන අතර, එය ඝන $Ag_3PO_4$ වැඩි වැඩියෙන් ද්‍රවණය කිරීමට හේතුවේ.

(29) pH ආවරණය (2.39 නිදසුන)

(30) $CaF_{2(s)} \rightleftharpoons Ca^{2+}_{(aq)} + 2F^-_{(aq)}$

මෙම සංතෘප්ත ද්‍රාවණයට ප්‍රබල අම්ලයන් එක් කළ විට පහත ක්‍රියාව සිදුවේ.

$H^+_{(aq)} + F^-_{(aq)} \rightleftharpoons HF_{(aq)}$

මෙමගින් ($F^-$) කරන බැවින් පද්ධතිය මත යෙදෙන සංරෝධය අඩු කිරීමට $CaF_2$ වැඩියෙන් ද්‍රවණය වේ.

(31) $Pbl_{2(s)} \rightleftharpoons Pb^{2+}_{(aq)} + 2l^-_{(aq)}$

මෙම සංතෘප්ත ද්‍රාවණයට ප්‍රබල අම්ලයක් එකතු කළ විට HI සෑදේ. මෙය ප්‍රබල අම්ලයකි. ∴ එය $H^+$ හා $l^-$ දෙමින් විඝටනය වේ. එබැවින් $PbI_2$ හි ද්‍රාව්‍යතාව කෙරෙහි එමගින් දැඩි බලපෑමක් නොකරයි.

(32) 2.4.7 ගුණාත්මක කැටායන විශ්ලේෂණයේ දී ද්‍රාව්‍යතා ගුණිතයේ යෙදීම්.

(33) II කාණ්ඩයේ කැටායන අවක්ෂේපණයේ රසායනය

IV කාණ්ඩයේ කැටායන අවක්ෂේපණයේ රසායනය

(34) I කාණ්ඩයේ කැටායන අවක්ෂේපණයේ රසායනය

(35) I කාණ්ඩයේ කැටායන අවක්ෂේපණයේ රසායනය

(36) නිදසුන 2.41

## පූර්ණ අමිශ්‍ර ද්‍රව/ද්‍රව පද්ධති වල ද්‍රාව්‍යයක ව්‍යාප්තිය විභාග/ ව්‍යාප්ති සංගුණකය




(1) පූර්ණ අමිශ්‍ර A හා B නම් ද්‍රාවක 2 ක් අතර ද්‍රාවක දෙකෙහිම දියවන X නම් ද්‍රාව්‍යයේ ව්‍යාප්තිය සඳහා වන නන්ස්ට් ව්‍යාප්ති නියමය සඳහන් කරන්න. ඒ සඳහා වන ප්‍රකාශනය ලබාගන්න. (ද්‍රාව්‍යතාව (s) හා සාන්ද්‍රණය(c) ඇසුරෙන්)

(2) නන්ස්ට් ව්‍යාප්ති නියමය යෙදීම සඳහා වන අවශ්‍යතා සඳහන් කරන්න.

(3) පූර්ණ අමිශ්‍ර ද්‍රව පද්ධති සඳහා උදාහරණ කීපයක් ලියන්න.

(4) ඉහත 1 ප්‍රශ්නයට අදාල රූප සටහන ඇසුරෙන් නියත උෂ්ණත්වයේ දී $K_D$ නියතයක් බව පෙන්වා දෙන්න.

A B ද්‍රාවකයට X අණු ගමන් කිරීමේ වේගය $= r_1$

A තුල X හි සාන්ද්‍රණය $= c_1$

B A ද්‍රාවකයට X අණු ගමන් කිරීමේ වේගය $= r_2$

B තුල X හි සාන්ද්‍රණය $= c_2$

ඉදිරි සහ පසු ප්‍රතික්‍රියා සඳහා සීඝ්‍රතා නියත පිළිවෙලින් $k_1$ හා $k_2$ ලෙස සලකන්න.

(5) X ඝනය $25^0C$ පවතින බෙන්සීන් හා ජලය මිශ්‍රණයට එකතු කරන ලදී. හොඳින් සෙලවූ විට හා සමතුලිත අවස්ථාවට පත්වූ විට බෙන්සීන් ස්ථරය $20cm^3 x 0.20g$ ඇති බවත් ජලීය ස්ථරයේ $100cm^3 x 0.40g$ ඇති බවත් සොයා ගන්නා ලදී. ද්‍රාවක දෙකෙහිම X එහි එහි සාමාන්‍ය අණුක ස්පරූපයෙන් පවතී නම් $K_D$ ගණනය කරන්න.

(6) ජලය හා බියුටනෝල් අතර එතනොයික් අම්ලයේ ව්‍යාප්තිය සඳහා වන ව්‍යාප්ති සංගුණකය පරීක්ෂණාත්මකව නිර්ණය කරන්නේ කෙසේද?

## පූර්ණ අමිශ්‍ර ද්‍රව/ද්‍රව පද්ධති වල ද්‍රාව්‍යයක ව්‍යාප්තිය විභාග/ ව්‍යාප්ති සංගුණකය - පිළිතුරු

(01)

- පූර්ණ මිශ්‍ර
  - → පරිපූර්ණ උදා:බෙන්සීන්/ටොලුයින්
  - → පරිපූර්ණ නොවන උදා:ජලය/එතනෝල්
- භාගිත මිශ්‍රන → ජලය/ප්‍රොපනෝල්
- අමිශ්‍ර → ජලය/බෙන්සින්

(02) පරිපූර්ණ ද්‍රාවන




$F_{A-A}$ $F_{B-B}$ $F_{A-A} = F_{B-B} = F_{A-B}$

$F_{A-A} = A - A$ අන්තර් අනුක ආකර්ෂණ බල

"දෙනලද උෂ්ණත්වයේ දී A සහ B සම්පූර්ණයෙන් මිශ්‍ර වන ද්‍රව මිශ්‍ර කිරීමෙන් සෑදුන ද්විඅංගී ද්‍රව මිශ්‍රනයක අන්තර් අනුක බල සමාන වන්නේ නම් ද, මිශ්‍ර කිරීමේ දී සිදුවන එන්තැල්පි විපර්යාසය ශුන්‍ය වන්නේ නම් ද එවැනි ද්‍රාවන පරිපූර්ණ ද්‍රාවන නම් වේ."

උදා: Hexane, Heptane

Chlorobenjen, Idobenjeue

$H_2O, D_2O$ වැනි සංස්ථානිත මිශ්‍ර

(03) A,B පරිපූර්ණ ද්‍රව මිශ්‍රනය සලකමු.

$$A_{(l)} \underset{r^1_c}{\overset{r_v}{\rightleftharpoons}} A_{(g)}$$

පහත දැක්වෙන ලෙස ඉදිරි ප්‍රතික්‍රියාව සීඝ්‍රතා ප්‍රකාශනය

.............................................................................................................................................................

$[A_{(l)}] \alpha X_A$ බැවින්

$r_V = [A_{(l)}] = K_1 X_A$

පසු ප්‍රතික්‍රියාව සඳහා සීඝ්‍රතා ප්‍රකාශනය

$r_v^1 =$ .............................................................................................................................................

$[A_{(g)}] \alpha P_A$ බැවින්

$r_V{}^1 = K^1[A_{(g)}] = K_2 P_A$

සමතුලිත විට, $r_V{}^1 = r_V$

$K_1 X_A = K_1 P_A$

$P_A = \dfrac{K_1}{K_2}$

$P_A = K X_A$

$\dfrac{K_1}{K_2} = K$

සංශුද්ධ A ඇතිවිට

$X_A = 1$

$P_A = P^0{}_A$

$\therefore P_A = P^0{}_A X_A$

එලෙසම B සංඝටකය සඳහා

$P_B = P^0{}_B X_B$ ලිවිය හැකිය.

රවුල් නියමයට අදාල සමීකරණය මෙය වේ.

මේ රවුල් නියමය වන්නේ,

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................